මධ්‍යම පළාත් සභාව
மத்திய மாகாண சபை
CENTRAL PROVINCIAL COUNCIL
මධ්‍යම පළාත් ප්‍රධාන හා අධ්‍යාපන
நிதி மற்றும் திட்டமிடல், சட்டம் ஒழுங்கு, உள்ளூராட்சி மற்றும் மாகாண நிர்வாகம், மனித வலு, தமிழ் கல்வி மற்றும் முஸ்லிம் பாடசாலை நடவடிக்கைகள், கலாசார விவகாரங்களும், காணி, வர்த்தகமும் வாணிபமும், உணவு விநியோகமும் பகிர்ந்தளிப்பும், சுற்றுலா, விளையாட்டு மற்றும், முதலீடு தொடர்பான அமைச்சு
மத்திய மாகாண பிரதான மற்றும் கல்வி
நிதியும் திட்டமிடலும், சட்டமும் ஒழுங்கும், உள்ளூராட்சி மற்றும் மாகாண நிர்வாகம், மனித வலு, தமிழ் கல்வி மற்றும் முஸ்லிம் பாடசாலை நடவடிக்கைகள், கலாசார விவகாரங்களும், காணி, வர்த்தகமும் வாணிபமும், உணவு விநியோகமும் பகிர்ந்தளிப்பும், சுற்றுலா, விளையாட்டு மற்றும், முதலீடு தொடர்பான ஒருங்கிணைப்பு, ஏனைய அமைச்சுக்களுக்கு கீழ் சேர்த்துக் கொள்ளப்படாத, விடயங்கள் தொடர்பான அமைச்சு
Central Provincial Chief And Education
Ministry of Finance and Planing, Law and order, Local Government and Provincial Administration, Man Power, Tamil Education and Muslim Schools Activities, Culture Affairs, Land, Trade and Commerce, Food Supplies and Distribution, Tourism, Sports and Investment Coordination Portfolios which are not taken under any other Ministries

පළාත් සභා සංකීර්ණය, පල්ලේකැලේ, කුණ්ඩසාලේ
மாகண சபைக் கட்டத் தொகுதி, பல்லேகலை, குண்டசாலை.
Provincial Council Complex, Pallekele, Kundasale.

විද්‍යුත් තැපෑල /மின் அஞ்சல்/E-mail : pcmcentral@gmail.com — වෙබ් අඩවිය/இ.தளம்/ Website : www.cpcm.lk

අමාත්‍යාංශ කාර්යාලය அமைச்சக அலுவலகம்/ Ministry Office	081-4481322	ලේකම් செயலாளர்/ Secretary	081-2424938	ජ්‍යේෂ්ඨ සහකාර ලේකම් சிரேஷ்ட உதவி செயலாளர்/ Senior Assistant Secretary	081-2424936	ප්‍රධාන ගණකාධිකාරී பிரதான கணக்காளர்/ Chief Accountant	081-2424935	ෆැක්ස් தொலைநகல்/ Fax	0812424938

මගේ අංකය எனது இல. / My No.	CPC/CMS/1/29/4/16	ඔබේ අංකය உமது இல. / Your No.		දිනය திகதி / Date	2026.08.04

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,
මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව.

මධ්‍යම පළාතෙහි සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නියුතු ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I, II සහ III ශ්‍රේණිවල නිලධාරීන්ගේ වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු - 2027

මධ්‍යම පළාත් සභාවට අනුයුක්තව සේවය කරනු ලබන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I, II, සහ III ශ්‍රේණිවල නිලධාරීන්ගේ වාර්ෂික අභ්‍යන්තර ස්ථානමාරු පරිපාටිය 2024.08.20 දිනැතිව මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇත. එම ස්ථානමාරු පටිපාටිය අනුව 2027 වාර්ෂික ස්ථානමාරු ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත බැවින් ස්ථානමාරු ලැබීමට සුදුසුකම් සම්පූර්ණ කර ඇති ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I, II, III ශ්‍රේණිවල නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (ස්ථානමාරු පටිපාටියේ දෘඪ පිටපතක් මේ සමග ඇමුණුම 01 ලෙස අමුණා ඇති අතර www.cm.cp.gov.lk යන මෙම අමාත්‍යාංශ නිල වෙබ් අඩවියෙහිද පළකර ඇත)

02. ඒ අනුව, ස්ථානමාරු පටිපාටියේ 07 වගන්තිය යටතේ දැක්වෙන විධිවිධානයන්ට යටත්වන නිලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙසත්, නියමිත නිර්දේශ සහිතව අයදුම්පත් මා වෙත යොමු කරන ලෙසත් දන්වන අතර, 2027 වාර්ෂික ස්ථානමාරු ක්‍රියාත්මක වන දිනය දක්වා සියලුම අභ්‍යන්තර ස්ථානමාරුවීම් හා සුහද ස්ථානමාරුවීම් සඳහා අයදුම්පත් භාර නොගන්නා බවද කාරුණිකව දන්වමි.

අයදුම්පත් යොමු කළ යුතු ආකාරය

I. වාර්ෂික ස්ථානමාරු සඳහා අයදුම් කරන සියලුම නිලධරයන් www.cm.cp.gov.lk යන මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පළකර ඇති වාර්ෂික ස්ථානමාරු අයදුම්පතෙහි ආදර්ශ ආකෘතියට අනුව නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කළ යුතුවේ. සම්පූර්ණ කරන ලද අයදුම්පත් **"ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික අභ්‍යන්තර ස්ථානමාරු - 2027"** යනුවෙන් අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කර **"ලේකම්, ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය, මධ්‍යම පළාත් සභා සංකීර්ණය, පල්ලේකැලේ"** යන ලිපිනයට 2026.08.31 දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් පමණක් යොමු කළ යුතුය.

II. අයදුම්පත් යොමු කළයුතු අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම සම්බන්ධ කිසිදු පැමිණිල්ලක් මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් භාරගනු නොලැබේ.

III. එක් නිලධරයෙකු එක් අයදුම්පතක් පමණක් යොමු කළ යුතුය.

අ.භ.ව.

Scanned with CamScanner

IV. 2026.12.31 දිනට අදාළව ඔබ දෙපාර්තමේන්තුවේ/කාර්යාලයේ අඛණ්ඩව වසර 06ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සහිත නිලධරයන්ගේ තොරතුරු මේ සමග අමුණා ඇති ඇමුණුම 02 ආකෘතිය අනුව නිවැරදිව සම්පූර්ණ කර 2026.08.31 දිනට හෝ ඊට පෙර, මෘදු පිටපත chiefminedu@gmail.com යන විද්‍යුත් ලිපිනයට සහ දෘඪ පිටපත මෙම අමාත්‍යාංශය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

03. රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 23/2026 චක්‍රලේඛය යටතේ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ස්ථානමාරු ක්‍රියාත්මක කිරීම අනුව එම ස්ථානමාරු ක්‍රියාවලියට බාධා නොවන පරිදි හා එම ස්ථානමාරු සමග ගැටීමක් ඇති නොවන පරිදි පහත කරුණු පදනම් කරගෙන වාර්ෂික ස්ථානමාරු පටිපාටිය ක්‍රියාත්මක කරනු ලබන බවද අවධාරණය කරමි.

I. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක 23/2026 හි වාර්ෂික ස්ථානමාරු සඳහා අනිවාර්යයෙන් යටත් වන නිලධාරීන් යටතට ගැනෙන 4.1.2 හා 4.1.3 හි සඳහන් සුදුසුකම් සපුරා ඇති සියලුම නිලධාරීන් එම චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ස්ථානමාරු සඳහා අයදුම් කළ යුතුවේ. එසේ අයදුම් නොකරන නිලධාරීන්ගේ තොරතුරු චක්‍රලේඛයේ 9.1 සහ 9.2හි සඳහන් පරිදි අදාළ ආයතන විසින් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කළ යුතුවේ.

II. පළාත් වාර්ෂික ස්ථානමාරු පටිපාටිය යටතේ පළාත තුළ පමණක් ස්ථානමාරු සිදු කරන බැවින් අන්තර් පළාත් ස්ථානමාරු අයදුම් කිරීමට අපේක්ෂිත, සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් උක්ත චක්‍රලේඛය අනුව ස්ථානමාරු අයදුම් කළ යුතුවේ.

III. රේඛීය අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 23/2026 හි සටහන (i) මගින් ලබාදී ඇති උපදෙස් අනුව, එකම සේවා ස්ථානයක වසර 12කට අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සහ වසර 06ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයන් පළාත් වාර්ෂික ස්ථානමාරු සඳහා සෘජුවම අදාළ කරගනු ලැබේ. එම චක්‍රලේඛය යටතේ ස්ථානමාරු කිරීමට යටත් නිලධරයන් (ස්ථානමාරු ඉල්ලුම් කිරීම අනුව හෝ අනිවාර්ය ස්ථානමාරුවලට යටත්වීම මත) ස්ථානමාරු කරනු නොලැබුවහොත් එම නිලධරයන්ගේ ස්ථානමාරුවීම් ද පළාත් වාර්ෂික ස්ථාන මාරු යටතේ සිදුකිරීමට නියමිත බැවින් එම නිලධාරීන්ටද මේ යටතේ ස්ථානමාරු අයදුම්කළ හැකි වන අතර අයදුම්පත්‍ර ඉදිරිපත් නොකළද එම නිලධාරීන් අනිවාර්ය සේවා කාලය ඉක්මවීම මත ස්ථානමාරුවලට යටත් වේ.

IV. අංක 23/2026 දරණ අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛය යටතේ ක්‍රියාත්මක වන ස්ථානමාරුවීම් සළකා බලා පළාත තුළ ස්ථානමාරුවීම් ක්‍රියාත්මක කළ යුතුවන බැවින් පළාත් වාර්ෂික ස්ථානමාරු පටිපාටියේ සඳහන් කාලරාමුව සංශෝධනයට යටත්ව ස්ථානමාරුවීම් ක්‍රියාත්මක කිරීමට නියමිත බවද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

මධුපානි පියසේන
ලේකම්
ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය
මධ්‍යම පළාත

Scanned with CamScanner